3 ඒකකය - විදුලි ජනනය(2)

✓ **පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න. අවශ්‍ය තැන්හි දී වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න.**

ක්‍රියාකාරකම 3.2

වියළි කෝෂයක් තුළ අඩංගු දෑ පරීක්ෂා කරමු

අවශ්‍ය ද්‍රව්‍ය :-

භාවිතයෙන් ඉවත් කළ වියළි කෝෂ කිහිපයක්, කියත් පටියක්, කඩදාසි කොළයක්, අඬුවක්, අත්වැසුම්

ක්‍රමය :- (ගුරු ආදර්ශනයක් ලෙස සිදු කරමු)

- කියත් පටිය ආධාරයෙන් භාවිතයෙන් ඉවත් කළ වියළි කෝෂය දික් අතට කපා ගන්න.
- කැපීමෙන් ලැබෙන අර්ධය හොඳින් නිරීක්ෂණය කරන්න.
- වියළි කෝෂයේ අඩංගු ද්‍රව්‍ය නිරීක්ෂණය කරන්න.
- ගුරුතුමාගේ සහාය ඇතිව වියළි කෝෂය තුළ විවිධ රසායනික ද්‍රව්‍ය ඇති බව හඳුනා ගන්න.
- පරීක්ෂාව අවසානයේ ගුරුතුමාගේ උපදෙස් ලබාගෙන රසායන ද්‍රව්‍ය ආරක්ෂිතව ඉවත් කරන්න.



3.2 රූපය ▲ වියළි කෝෂ තුළ අඩංගු ද්‍රව්‍ය

ක්‍රියාකාරකම 3.3

දෙහි ගෙඩියෙන් විදුලිය උත්පාදනය කිරීම

අවශ්‍ය ද්‍රව්‍ය :- යුෂ පිටතට නො එන පරිදි හොඳින් තෙරපන ලද දෙහි ගෙඩියක්, කොපර් තහඩුවක්, සින්ක් තහඩුවක්, සම්බන්ධක වයර, සංගීත නාදය නිපදවන සුබ පැතුම් පතක් තුළ ඇති පරිපථ කොටස හෝ මිලි ඇමීටරයක්

ක්‍රමය :-

- දෙහි ගෙඩිය සිදුරු කර කොපර් හා සින්ක් තහඩු දෙක ඇතුළු කරන්න. (තහඩු එකිනෙක නොගැටෙන පරිදි ඉතා ආසන්නව)
- එම තහඩු දෙකට වයරය බැගින් සම්බන්ධ කරන්න.
- ඔබ සවි කළ වයර මිලි ඇමීටරයට හෝ සංගීත නාදය නිපදවෙන සුබ පැතුම් පතෙහි පරිපථයේ ඇති කෝෂය ඉවත්කර එම ස්ථානයට නිවැරදිව සම්බන්ධ කරන්න. (තඹ තහඩුව + අග්‍රයට හා සින්ක් තහඩුව - අග්‍රයට)
- ඔබට කුමක් නිරීක්ෂණය කළ හැකි ද?